C
373
NUG

UNIVERSITY OF PERADENIYA
23-8-1988
LIBRARY

# ශිෂ්‍ය කාර්යසාධනය කෙරෙහි ගුරු අපේක්ෂණවල හා සමාජ පංතියේ බලපෑම.

(ශ්‍රී ලංකාවේ පාසැල් ආශ්‍රිත පර්යේෂණාත්මක අධ්‍යයනය)

එච්.කේ. නුගේගොඩ මිය (බී.ඒ. ලංකා )
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (සම්මාන)

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන ශාස්ත්‍රපති උපාධිය සම්බන්ධ අවශ්‍යතා අර්ධ වශයෙන් පූරණය කිරීම පිණිස ඉදිරිපත් කරන පර්යේෂණාත්මක නිබන්ධනය.

412017

පර්යේෂණ උපදේශක: ආචාර්ය එල්.එස්. පෙරේරා

1986 ජූලි.

## සාරාංශය.

'ශිෂ්‍ය කාර්යසාධනය කෙරෙහි ගුරු අපේක්ෂණවල හා සමාජ පංතියේ බලපෑම' යන මාතෘකාව යටතේ මෙම අධ්‍යයනය, මහනුවර ප්‍රදේශයේ පාසල් හොඳින් නියෝජනය වනසේ තෝරාගත්, නියැදියකින් යුක්තවේ. තෝරාගත් පාසැල් 11 කින්, සමාජ පංතිය අනුව සිසුන් 150 ක් නියැදිය වශයෙන් තෝරාගන්නා ලදි. ඔවුන්ගේ කාර්යසාධනය මැනීම සඳහා යොදාගන්නා ලද්දේ, එම නියැදිය විසින් 1982 අ.පො.ස.ප. සාමාන්‍ය පෙළ විභාගයෙන් ලබාගත් ප්‍රතිඵලය. මෙම අධ්‍යයනයේ අනාවරණයන් කෙටියෙන් මෙසේය.

1. ශිෂ්‍යකාර්ය සාධනය හා ගුරු අපේක්ෂණ අතර සෑම සමාජ පංතියක් සම්බන්ධයෙන්ම වෙසෙසි සහසම්බන්ධයක් ඇත. ගුරු අපේක්ෂණ ස්ථිර වශයෙන්ම ශිෂ්‍ය කාර්යසාධනය කෙරෙහි බලපාන අතර, සිසුන්ගේ සමාජ පංතිය පහළ වූ තරමට, ගුරු අපේක්ෂණ හා කාර්යසාධනය අතර ඇති බැඳීම වැඩි බවද අනාවරණය වේ.

2. ශිෂ්‍ය කාර්යසාධනය හා සමාජ පංතිය අතර ප්‍රබල සම්බන්ධයක් ඇත. සමාජ පංතිය ඉහළ වූතරමට කාර්යසාධනයද ඉහළ මට්ටමක පිහිටයි. එසේම පහළ සමාජ පංතිවල සිසුන්ගේ කාර්යසාධනය, සාපේක්ෂව පහළ මට්ටමක පිහිටා ඇත.

3. විෂයයන් වශයෙන් ගත් විට එක් විෂයයක් උගන්වන් ගුරුවරයකුගේ අපේක්ෂණ මට්ටම වෙනත් ගුරුවරයකුගේ අපේක්ෂණ මට්ටම ඉක්මවා යන්නේය. එසේ වුවද එක් එක් විෂයය උගන්වන ගුරුවරුන්ගේ අපේක්ෂණ මට්ටම් අතර විශාල පරතරයක් නොමැත. විවිධ විෂය උගන්වන ගුරුවරුන්ගේ අපේක්ෂණ මට්ටම් බොහෝ දුරට එකිනෙකට ආසන්නව පිහිටා ඇත.

4. ගුරු අපේක්ෂණ හා ළමුන්ගේ ස්ත්‍රී/පුරුෂ භාවය අතර සම්බන්ධයක් ඇත. ගුරු අපේක්ෂණ තරාවන් සහ ගැහැනු හා පිරිමි ළමුන්ගේ කාර්යසාධන තරාවන් අතර සම්බන්ධන සංගුණක ගණනය කළ විට, වැඩි සම්බන්ධයක් දක්නා ලද්දේ පිරිමි ළමුන් සම්බන්ධයෙනි. මේ අනුව පිරිමි ළමුන් සම්බන්ධයෙන් ගුරු අපේක්ෂණ හා කාර්යසාධනය අතර වැඩි සම්බන්ධයක් ඇති බව අනාවරණය වේ.

5. ගුරු අපේක්ෂණ හා සමාජ පංතිය අතර සැලකියයුතු සම්බන්ධයක් පවතී. මෙය ගුරු-අපේක්ෂණ හා කාර්යසාධනය අතරත්/සමාජ පංතිය හා කාර්යසාධනය අතරත් ඇති සම්බන්ධය තරමටම ප්‍රබල නොවේ. එහෙයින් ගුරු අපේක්ෂණ හා සමාජ පංතිය අතර ඇත්තේ මධ්‍යස්ථ ප්‍රමාණයේ සම්බන්ධයකි.

6. අ.පො.ස.ප. සාමාන්‍ය පෙළ විභාගයෙන් සාර්ථක ප්‍රතිඵල ලබා ඇත්තේ වැඩි වශයෙන්ම ඉහළ සමාජ පංතියට අයත්, ඉහළ ගුරු අපේක්ෂණ තුළ පිහිටි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ය. ඔඩුනතුරින් ද, සමාජ පංති තරාවෙන් හා ගුරු අපේක්ෂණ තරාවෙන් ඉහළින්ම පිහිටි පිරිසෙන් වැඩි සංඛ්‍යාවක් උසස් පෙළ විභාගයට පෙනිසිට සාර්ථක ප්‍රතිඵල ලබා ඇත. සමාජ පංති තරාවෙන් තරමක් අඩු, එහෙත් ගුරු අපේක්ෂණ තරාවේ ඉහළින් පිහිටි පිරිසෙන් අඩක් පමණ උසස් පෙළ විභාගයට පෙනිසිට, එයින්ද තුනෙන් එකක් පමණ සාර්ථක ප්‍රතිඵල ලබා ඇත. සමාජ පංති තරාවෙන් මෙන්ම ගුරු අපේක්ෂණ තරාවෙන්ද ඉතා පහළ මට්ටමක පිහිටි ශිෂ්‍ය නියැදියෙන් උසස් පෙළ විභාගයට පෙනිසිට සාර්ථක ප්‍රතිඵල ලබා ඇත්තේ මුළු නියැදියෙන් 2% ක් පමණකි.